12 වන පිටෙන්

බෑණා තුන් වතාවකුත් මිනිබිරි දෙවතාවකුත් මුනුබුරා එක් වතාවකුත් ලංකාවට ගිහින් තියෙනවා. මගේම ගෙදරක් මහනුවරට කිට්ටුව ලේවැල්ලේ තිබීම අපේ ගමන් වලට මහත් උදව්වක්. 1977 අවුරුද්දේ අපි කසාද බැන්දේ මහනුවරදී. ඒ දිනවල අපිට අවශ්‍ය දේ ගැනීම ඉතාම අමාරුවුණේ හේතු දෙකක් නිසා. එක හේතුවක් වුණේ සල්ලි නැතිකම. අනික් හේතුව වුණේ කඩවල බඩු නැතිවීම. Sugar, Toilet Paper, Air Mail Envelopes..... වගේ බොහෝ දේ කඩවල තිබුණේ නැහැ. කොළඹ යාළුවන්ගේ හෝ නෑදෑයන්ගේ ගෙවල් වල ජීවත් වූ නිසා වියදම් ටිකක් අඩුවුණත් ජීවත්වුණේ ඉතුරුකර තිබූ සල්ලි වලිනුයි. ක්වීන්ස්ලන්තයේ හැදුන වැඩුන මගේ බිරිඳට ලංකාවේ ගෙවන්න වුණ ජීවිතේ ලේසිවුණේ නෑ.

ඒ කෙසේ වෙතත් අපි 1983 දී ලංකාවේ විශ්‍රාම ගත්තා. අපේ ගමේ විදුලිය හෝ ටැප් වතුර නැතිවුණත් අපි සතුටෙන් අවුරුද්දක් එහේ හිටියා අපෙ අප්පච්චිත් එක්ක. අපි ආපසු ඔස්ට්‍රේලියාවට එන්න තීරණය කළේ මගේ අප්පච්චිගේ අභාවයෙන් පස්සෙ.

දැන් ආපසු පසුගිය හතලිස් වසර දෙස බලනකොට අපි දකින්නේ සම්පූර්ණයෙන්ම වෙනස් රටක්! නුවර දළදා වීදියේ ඒ දවස් වල ගොං කරත්ත ගියා. දැන් තියෙන්නෙ සුපර්මාර්කට්. හදිස්සියකට දුරකතනයක් සොයා ගෙන ඒ දවස් වල ගෙයින් ගෙට ගියා. දැන් පොල් කඩන මිනිහා ගහ උඩ ඉඳන් කෝල් කරන්නේ "නෝනා මේ ඉත්තෙන් කඩන්නද" කියලා. ඒකට ගමේ කියන්නේ පොල් ෆෝන් කියලා.

අනික් පැත්තෙන් දැන් මිනිස්සු පොත් කියවනවා අඩුයි. ඉස්සර වගේ ඕනෑම දෙයක් ගැන කතා කරනවා අඩුයි. ටී.වී, ෆේස්බුක්, ඉන්ටනෙට් තියෙද්දි ආයෙ මොකටද පොත් කියවන්නේ හරි කතාබහ කරන්නේ හරි කියලා ඔවුන් හිතනවා ඇති. ඉස්සර අමාරුවෙන් බස්වල එල්ලිලා ගිය අයටම දැන් කාර් - ත්‍රීවීල් නැතුව ගමන් යන්න බෑ. මගේ හිතට තියෙන ලොකුම අමාරුව තමයි මිනිස්සු පයින් යන්න දක්වන අකමැත්ත.

රට ඉස්සරට වඩා දියුණුයි. ඒ වගේම දූෂණය වැඩියි. දූෂණය වැඩි වීමටත් වඩා නරක දෙය හැටියට පෙනෙන්නේ මිනිස්සු දූෂණය සාමාන්‍ය දෙයක් හැටියට පිළිගැනීමයි. ඇත්තටම මේ ප්‍රශ්ණෙ ගැන සතියක් වුණත් කතා කරන්න වටිනවා.

08. ලාංකීය සූප ශාස්ත්‍ර ක්‍රම ගැන ඔබේ ඇති උනන්දුව මොනවගේද?

ලාංකික සූප ශාස්ත්‍ර ක්‍රම ගැන මම යමක් කරනවද නැද්ද කියන එකත් ප්‍රශ්නයක්. සෑම අවුරුද්දෙම සිංහල අවුරුද්දටත් ජනවාරි පලවෙනිදටත් මම මුංඇට කිරිබත් ලෑස්ති කරනවා. නමුත් ඒවා කන්නෙත් මම විතරයි. බිරිදත් පුතත් කිරිබත් වලට කැමති නැහැ. ඔස්ට්‍රේලියානු ජාතික අමුත්තන් රෑ කෑමකට ආවොත් අපි ඔවුන්ට දෙන්නෙ ලාංකික කෑම. පොල් සම්බෝලය හැරුණු කොට බොහෝ විට ඒවා ලෑස්ති කරන්නේ මාගරට්.

කෑම ගැන මම ඒ තරම් කරදර වෙන්නේ නෑ. සමහරු ඕනෑවට වැඩිය කෑමක රස වර්ණනා කරනවා අහන්නත් මම කැමති නැහැ. මගේ අදහස කෑම කියන්නේ ඇඟට ඉන්ධන මිස කලාවක් නෙවෙයි. එය වැරදි මතයක් වෙන්නත් පුළුවන්. ඒත් මගේ හිතේ තියෙන්නේ එවැනි මතයක්.
තනියම ලංකාවේ ඉන්න දවස්වල මම බොහෝ විට කන්නේ බතල, මඤ්ඤොක්කා, දෙල් වගේ දේ තම්බගෙන පොල් සම්බෝලෙකුත් එක්ක. බත් ඉව්වොත් ඒකටම පරිප්පු, පලා වර්ග එහෙම දාලා එක සාස් පානකින් බේරෙනවා. අමුත්තෝ ආවොත් විතරයි වෙන කෑම ලෑස්ති කරන්නේ. මේ නිසා මගේ සූප ශාස්ත්‍ර දැනීම මම කිසි කෙනෙකුට ලැබේවාය් ප්‍රාර්ථනා කරන්නේ නෑ.

09. දශක හතරක් තුල ඔස්ට්‍රෙලියාවෙ ගෙවුන ජීවතය පිළිබඳ ඔබෙ හැඟීම කෙබඳුද?

මුලදි "අමුතු" ගතියක් දැනුණත් ඔස්ට්‍රේලියානු ජීවිතේට පුරුදුවීම අමාරු නැහැ. මම හිතන්නේ ඔස්ට්‍රේලියානුවෝ බොහෝ දෙනෙක් ලාංකිකයෝ වගේම සාමාන්‍ය මිනිස්සු. රටවල් දෙකේම ඉන්නවා මගේ සිතිවිලි වලට හැසිරීම් වලට විරුද්ධ අය. ඒක ඒ අයගෙ ප්‍රශ්නයක් මිස මගේ ප්‍රශ්නයක් නොවෙයි. මට මුණගැසුන මිනිසුන් ගැන මට කිව හැක්කේ එකම දෙයයි. නජප්ජා වසලෝ හෝතී; නජප්ජා හෝති බ්‍රාහ්මණෝ; කම්මනා වසලෝ හෝතී; කම්මනා හෝති බ්‍රාහ්මණෝ; මේ නීතිය පාවිච්චි කළොත් මා දකින විදියට රටවල් දෙකක් කියලා වෙනසක් නැහැ.

10. Karoonka.com නිර්මාණය කිරීමේදී ඔබ භාවිතා කළ තාක්ෂණික ක්‍රමවේද කවරේද?

මගේ ලිවීම සිදුවන්නේ "පැන්සල" නමැති මෘදුකාංගය භාවිතයෙන් Microsoft Word වලයි. ඉන්පසු මගේම අච්චුවක් පාවිච්චියෙන් කතා html වලට හරවා karoonka.com වලට එකතු කළා. සිංහල යතුරු පුවරුවක් පාවිච්චියේ පුරුද්දක් නැති නිසා මම තවමත් ලියන්නේ "සිංග්ලිශ්" ක්‍රමයට. (ඉංග්‍රීසි අකුරු වලින් සිංහල ලිවීම) සමහර අකුරු හරියට නොලියවුණත් මම මේ ක්‍රමය පාවිච්චි කරන්නේ එසේ නොකළොත් මාසෙකට එක කතාවක්වත් ලියන්න බැරිවෙන නිසයි.

11. සිංහල භාෂාව පිළිබඳව ඔබ තුල පවතින අවංක මතය ප්‍රකාශ කරන්න කැමතිද?

සිංහල භාෂාව ගැන යමක් කීමට මට දැනුමක් නැහැ. නමුත් එක දෙයක් කිව හැකියි. 1973 මා දුටු සිංහලට වැඩිය බර වචන බොහොමයක් 2018 සිංහල පත්තර වල තිබුණා. 1973 දී මා නොදුටු මා නොඇසූ වචන (උදාඃ අදාල නෑ) මෑතකදී මගේ නෑදෑයෝ පාවිච්චි කළා. "ආතල්", "එල" වගේ අළුත් වචනත් දැන් තියෙනවා. භෂාවක් වෙනස් වීම ස්වාභාවිකයි. මට හිතෙන්නේ මම තවම දන්නේ මම තවම කතා කරන්නේ 1970 වේ භාවිතා කරපු සිංහල විතරයි කියලා.

අනික් අතට බොහොම සිංහල රේඩියෝ නාලිකා වල කතා කරන සිංහල ගැන මට දුකක් ඇතිවෙනවා. ඒ අයගෙ කතාවල ඉංග්‍රීසි වචන පිරිලා. මම නාකියෙක් නිසා එහෙම දකිනවා වෙන්නත් පුළුවන්. නමුත් මම කැමතියි ඒ අය එක වෙලාවකට එක භාෂාවක් පමණක් පාවිච්චි කරනවනම්. තවමත් මම ලංකාවෙදි මගේ බිරිඳ එතැන නැතිනම් සිංහල පමණක් කතා කිරීමට උත්සාහ කරනවා. නමුත් මම දන්න බොහොම අය අනික් අයට සිංහලෙන් කතා කරන අතරේ මට මට ඉංග්‍රීසියෙන් කතා කරනවා. මේ ගැන මට ටිකක් කණගාටුයි. නමුත් ඒකට කිසිම දෙයක් මට කරන්න අමාරුයි.

38 වන පිටෙන්

ජාතියේ අමුතුම මලක් පැන නැඟුනා. කොළ මැණිකක දිස්නය තිබුණු හීනි දිගටි කොලත් ඒ මැද්දේ රත්තරන් පාට කෝප්පයක් වගේ මලකුත් තිබුණා. ඒක කොයිතරම් ලස්සනද කියනවා නම් හාවාට අඬන්නත් අමතක වෙලා වැතිරිලා ඒ දිහාවේ බලාගෙ නම හිටියා. ටික වෙලාවකින් මලේ පෙති දිගඇරිලා සුරංගනාවියක් එළියට ආවා. ඈ මුළු ලෝකේම හිටිය ලස්සනම සුරංග නාවිය. ඇගේ ගවුම මහලා තිබුණේ මුතු ඇටයි පිණි කැටයි එකතු කරලා. ඇගේ බෙල්ල වටේත් කෙහෙරැළි අතරේත් මල් ගවසලා තිබුණා. ඇගේ මූණත් ලස්සන මලක් වගේ පෙනුණා. ඈ පුංචි හාවා ළඟට ඇවිත් එයාව තුරුළු කරගෙන, අඬලා තෙත් වෙලා තිබුණු එයාගේ පුංචි විල්ලුද නහයට හාදුවක් දුන්නා.

''පුංචි හාවෝ'' ඈ කීවා, ''ඔයා දන්නවාද මම කවුද කියලා?''

හාවා ඈ දිහා හොඳහැටි බැලුවා. ඈව කළින් දැකලා හුරු බවක් දැනුණත් ඒ කොහෙදිද කියලා හාවාට මතක් වුණේ නැහැ.

''මම තමයි සෙල්ලම් කාමරයේ මායාවට අධිපති සුරංගනාව'' ඈ කීවා. ''ළමයි ආදරය කළ සෙල්ලම් බඩු බලාගන්නේ මම තමයි. ඒවා පරණ වෙලා, අබලන් වෙලා ළමයින්ට තවදුරටත් ඕනේ නැති වුණාම මම ඒවා අරගෙන ගිහින් පණ දෙනවා.''

''මට කළින් පණ තිබුණේ නැද්ද?'' පුංචි හාවා ඇහුවා.

''පිරිමි ළමයා ඔයාට ආදරේ කළ නිසා ඔයාට පණ තියෙන බවක් දැනුණේ එයාට විතරයි. ඒත් දැන් ඔයා හැම කෙනෙකුටම දැනෙන විදිහට පණ ලබන්න හදන්නේ''

එහෙම කියලා ඈ පුංචි හාවා ව දෑතින්ම තුරුළු කරගෙන කැලයට පියාඹලා ගියා. ඒ වෙද්දී හඳ පායලා තිබුණු නිසා හැමතැනම ආලෝකය පැතිරුණා. ගස් වල අතු තුහින වැටිලා රිදී පාටට දිලිසෙමින් තිබුණු නිසා මුළු කැලයම ලස්සනට පෙනුණා. ගස් අතරේ එළිමහනක කැලෑ හාවෝ තමන්ගේ හෙවනැලි එක්ක සෙල්ලම් කරමින්, විල්ලුද තණ පලසේ නටමින් හිටියා. සුරංග නාවිය දුටුව ගමන් ඒ අය තමන්ගේ නැටුම් නවත්තලා රවුමට හිටගෙන ඈ දිහා දෑස් දල්වාගෙන බලා හිටියා.

''මම ඔයාලට සෙල්ලම් කරන්න අලුත් යාලුවෙක් ගෙනාවා.'' සුරංගනාවිය කීවා. ''ඔයාලා එයාට බොහොම කරුණාවන්ත වෙලා හාවන්ගේ ලෝකයේ හැම දෙයක්ම එයාට කියලා දෙන්න ඕන. මින්පස්සේ එයා හැමදාටම ඔයාලා එක්ක ඉන්නයි යන්නේ.''

එහෙම කියලා ඈ පුංචි හාවාට හාදුවක් දීලා එයාව තණ බිස්සෙන් තිබ්බා.
''දුවලා ගිහින් සෙල්ලම් කරන්න පුංචි හාවෝ!'' ඈ කීවා.

ඒත් පුංචි හාවා නිසොල්මන්ව මොහොතක් වාඩිවෙලා හිටියා. අනෙත් කැලෑ හාවන්ගේ නැටුම් දකිද්දී එයාට හදිසියේ මතක් වුණා තමන්ගේ පස්සා ගාත් ගැන. තමන් තනි හැඩේට නිමවලා තියෙන බවක් ඒ අය දකිනවාට හාවාට අකමැත්තක් දැනුණා. සුරංගනාව අන්තිම වතාවට තමන්ට හාදුවක් දෙද්දී තමන් සම්පූර්ණයෙන්ම වෙනස් කළ බව එයා දැනගෙන හිටියේ නැහැ. නහයට පුංචි කිතියක් නොදැණුනා නම් තව සෑහෙන්න වෙලාවක් හෙල්ලෙන්නෙවත් නැතිව ලැජ්ජාවේ එයා එහෙමම ඉන්න තිබ්බා. පුංචි හාවා නහය කසන්න තමන්ගේ පස්සා ගාතයක් ඉබේම ඉස්සුවා. ඒ වෙලාවේ තමයි තමන්ට පස්සා ගාත් තියෙන බව එයා දැනගත්තේ! ඊට අමතරව පරණ විල්ලුද රෙද්ද වෙනුවට තමන්ට දැන් දිලිසෙන දිග දුඹුරු ලොම් තියෙන බවත්, ඉබේම වගේ නැටවෙන කන් තියෙන බවත්, තණකොළ වල ගෑවෙන තරමේ දිග රැවුල් ගස් තියෙන බවත් හාවා දැක්කා. පස්සා ගාත් ලැබීමේ සතුටට එයා ලොකු පිනුමක් ගහලා තණබිස්ස වටේටම පැන පැන ගියා. එහෙම බොහොම උද්යෝගයෙන් අනෙත් අය කළ විදිහට ඒ පැත්තට, මේ පැත්තට පහිමින්, කැරකෙමින් උන්නු හාවා හදිසියේ මතක් වෙලා, නැවතිලා සුරංගනාවිය හොයද්දි ඈ අතුරුදහන් වෙලා තිබුණා.

අවසානයේදී හාවා අනෙත් හාවෝ අතරේ ඇත්තම, පණ තියෙන හාවෙක් බවට පත්වුණා.

හේමන්ත කාලයත් සීත කාලයත් ගෙවිලා ගියා. වසන්ත කාලය ආයෙත් ඇවිත් උණුසුම්, හිරු එළිය පිරුණු දවස් එළඹුනාම පිරිමි ළමයා ගේ පිටිපස්සේ කැලයට සෙල්ලම් කරන්න ගියා. එහෙම සෙල්ලම් කරද්දී හාවෝ දෙන්නෙක් පඳුරු අතරින් රිංගලා ඇවිත් එයා දිහා එබිලා බැලුවා. ඉන් එක්කෙනෙක් තනි දුඹුරු පාටයි. ඒත් අනෙත් එක්කෙනාගේ ඇගේ ලොම් යටින් අමුතු පුල්ලි ලකුණු තිබුණේ හරියට ඉස්සර ඒ ඇගේ පුල්ලි තිබුණා වගේ. ඒ පුංචි සිනිඳු නහයේත්, රවුම් කළු ඇස් දෙකේත් මොකක්දෝ හුරුපුරුදු බවක් දැනුණු නිසා ළමයා මෙහෙම හිතුවා

''අර හාවා නම් මම උණ හැදිලා උන්නු කාලේ නැතිවුණු මගේ පරණ හාවා වගේමයි!''

ඒත් ඒ එයාගේ පරණ හාවා ම බව ළමයා දැනගෙන හිටියේ නැහැ. ඒ හාවා ඇවිත් තිබුණේ තමන්ට මුලින්ම පණ දුන්නු පුංචි ළමයාව බලලා යන්න යි.